# මෙරටේ පවත්නා බලගතුම නීතිය වන්නේ වත්කම් හා බැරකම් නීතියයි

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් පවතින රටවල දේශපාලකයින්ටයි, රාජ්‍ය නිලධාරීන්ටයි අදාළ වැදගත්ම නීතියක් වන්නේ වත්කම් බැරකම් නීතියයි. එහි තිබෙන වැදගත්ම කාරණාවක් නම් වත්කම් බැරකම් නීතිය යටතේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් තුළ දේශපාලකයින්ට, නීතිඥයින්ට, පළාත් පාලන සභිකයින්ට සහ උසස් රාජ්‍ය නිලධාරීන්ට පොදුවේ තමන්ගේ තනතුරු කරන අතර ව්‍යාපාර කල නොහැකි වීමයි.

අනෙක් කරුණ නම් ඒ කිසිවෙකුට පවත්නා රජය සමග ගණුදෙනු කල නොහැකිය යන්න පිළිගත් මූලධර්මයකි. මෙම සම්ප්‍රදාය 1977 දක්වාම ලංකාවේ හොඳින්ම ක්‍රියාත්මක වූ අතර ඔබලා හොඳින් දන්නා පරිදි ගාල්ල දිස්ත්‍රික්කයේ සිටි මහජන නියෝජිතයෙක් වන අනුර සිල්වා යැයි නම් ලත් මන්ත්‍රීවරයාගේ මන්ත්‍රීධූරය වරක් අහිමිවිය. ඊට හේතුව වූයේ ඔහු සතුව ගාල්ලේ පිහිටා තිබූ ඉන්ධන පිරවුම් හලකි. (සැබවින්ම එය අඩුතරමින් පෙට්‍රල් හෝ නිකුත් නොකරන භූමිතෙල් පමණක් නිකුත් කරන ලද්දකි).

මෙලෙස උසස් සම්ප්‍රදායක්ව පැවති වැදගත් දේශපාලන සම්මතයන් හා මැතිවරණ ආශ්‍රිත නීති වසර 1977 පසුව කුණුකූඩයට දැමීම නිසා මෙරටේ සමාජ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ හිඩැස අසාමාන්‍ය විය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ඉඩම්, දේශපාලකයින්ට හා උසස් රාජ්‍ය නිලධාරීන්ට සොච්චම් මුදලකට ලබාදීමට ක්‍රමයක් ආරම්භ වීම ද මෙරටේ දේශපාලනය අපකීර්තියට ලක් කරන ලද සංසිද්ධියක් වූ අතර මන්ත්‍රීවරුන්ට ලබාදුන් ප්‍රවාහන බලපත්‍ර හා පොදු මගී සේවා බලපත්‍ර කොන්ත්‍රාත් නිසා ද ඇති වූ දේශපාලන විෂමතාවය ඉතා ප්‍රබල විය. මෙකී නරක පසුබිම තුළ සිදුවූ ආසන්නතම අහිතකර ප්‍රතිඵලය වූයේ මන්ත්‍රීවරුන් වැව්ලිකරුවන් හෝ කොන්ත්‍රාත්කරුවන් වීමත් අවසානයේදී ඔවුන්ගෙන් බහුතරයක් ව්‍යාපාරිකයන් වීමත්ය.

වසර 1977 වන තෙක්ම මෙරටේ උත්තරීතර ආයතනය බවට පත්ව තිබුණේ පාර්ලිමේන්තුවයි. එහෙත් මෙකී උත්තරීතරත්වය අවතක්සේරු කිරීමේ ඉතා ප්‍රබල වුවමනාවකින් කටයුතු කරන ලද තැනැත්තෙක් වූයේ මෙරටේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා වූ ජේ. ආර් ජයවර්ධනයි. ඔහු මෙම ඉලක්කය සපුරාගන්නා ලද්දේ මන්ත්‍රීවරුන්ට හැකිතාත් වරදාන ලබාදීම මගිනි. තමන් විධායක ජනාධිපතිවරයා ලෙසින් රටෙහි උත්තරීතර නායකයා ලෙස පත්වීමට යන ගමනේදී මන්ත්‍රීවරුන් අතර යම් නොසන්සුන්තාවක් තිබේනම් එය සමනය කර ගැනීම සඳහා ජනාධිපතිවරයා අනුගමනය කරන ලද මාර්ගය වූයේ මන්ත්‍රීවරුන්ට ව්‍යාපාරිකයන් වීමට අවශ්‍ය මාර්ගය සකස් කිරීමයි. එය කෙතරම් යථාර්ථයක් බවට පත්ව තිබේද යත් අද වන විට මෙරටේ මන්ත්‍රීවරුන් සතුව පවත්නා සුරාසැල් (බාර්) බලපත්‍ර ප්‍රමාණය 1167 කි. ඒවා බොහෝමයක් ලියාපදිංචි කොට ඇත්තේ ඔවුන්ගේ නමින් නොවේ. පවුලේ සාමාජිකයන්ගේ නම් අයිතිකරුවන් සේ යොදා තිබීම සාමාන්‍ය ස්වභාවයයි.

ලංකාවට වත්කම් බැරකම් නීතිය හඳුන්වා දෙන ලද්දේ වසර 1975 දීය. නමුත් එම නීතිය හඳුන්වනුයේ 1975 වත්කම් බැරකම් නීතිය ලෙසයි. එම නීතිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන මන්ත්‍රීවරුන් සහ රජයේ හෝ රජයට සම්බන්ධ සංස්ථා හෝ ආයෝජනය කොට ඇති ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් අවුරුදකට වරක් තමන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට නීතියෙන් බැඳී සිටී. නමුත් එකල සාමාන්‍යයෙන් සිද්ධ වූයේ එලෙස නම් කරන ලද බලධාරීයා එකී වත්කම් බැරකම් ප්‍රකාශ රැගෙන කදිම ආරක්ෂිත සේප්පුවක තබා වසා තැබීමයි. එලෙස බහා තැබූ විට ඒවා අඩුතරමින් එළියට හෝ ගන්නා ලද්දේ යම් පරීක්ෂණයකදී හෝ අධිකරණ නියෝගයක් ලද විට පමණි. සැබවින්ම මෙම නීතියේ විශාල වෙනසක් ඇති කරන ලද්දේ 1988 අංක 74 දරණ වත්කම් බැරකම් සංශෝධන පනත මගිනි. එය පාර්ලිමේන්තුවේ 3/2 ඡන්දයකින් සම්මතවීම විශේෂිත කරුණකි. ලංකාවේ බොහෝ දෙනෙක් නොදන්නා කරුණක් වන්නේ මෙම වත්කම් බැරකම් නීතිය සම්මත කර ගන්නා ලද්දේ වසර 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පසුව බවයි.

ඒ අනුව පැහැදිලි වන්නේ අප මෙලෙස සාකච්ඡා කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තරම්ම බලවත් නීතියක් ගැනය යන්නයි. මාගේ පුද්ගලික හැඟීම නම් මෙම නීතිය යටතේ ජනාධිපතිවරයාට පවා මුක්තියක් නැතිය යන්නයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයා හට ඔහුගේ අයිතිවාසිකම්වලට අදාළව යම් ආරක්ෂණයක් සහතික කොට තිබුණ ද මෙම නීතියෙන් ගැලවීමක් නොමැති බව පැහැදිලි කරුණකි. යම් ජනාධිපතිවරයෙක් දැනට පවත්නා මැතිවරණ ක්‍රමවේදයට අනුගතව ජනාධිපති ධූරය සඳහා දෙවරක් තරග කිරීමට උත්සාහ කරන කලෙක එකී දෙවන අවස්ථාවේදී පැහැදිලිවම්ඔහු හෝ ඇය මෙම වත්කම් හා බැරකම් ප්‍රකාශ නිවැරදිව ඉදිරිපත් කළ

යුතුය. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම නීතිය මෙරටේ දැනට පවත්නා නීතිමය සංශෝධන සළකා බලන කල ඉතා විප්ලවකාරී එකක්ය යන්නයි.

වත්කම් බැරකම් ප්‍රකාශ පිටපත් මහජනයාට නිශ්චිත ගාස්තුවක් ගෙවා ලබා ගැනීමේ අයිතිය ලබා දීම සහ එමගින් අපේක්ෂා කරන ලද්දේ අදායම් උපයීම පිළිබඳ යම් සැකයක් පවතින්නේ නම් ඒ පිළිබඳ නිසි විමසීමක් කොට තම අදහස් ජනගත කිරීමට මහජනතාවට ඉඩකඩ සළසාදීමයි. මෙහි පවත්නා අතිශය බරපතල තත්ත්වය වන්නේ යම් පුද්ගලයෙක් රුපියල් 750ක් වැනි මුදලක් වැය කොට තම සන්තකයට ගනු ලබන වත්කම් බැරකම් ප්‍රකාශයක යම් දෝෂයක් පෙන්වා එමගින් අදාළ මන්ත්‍රීවරයා වරදක් කොට ඇතැයි ඔප්පු වුවහොත් එකී මන්ත්‍රීවරයාට කිසිදු පිලිසරණක් නොලැබීමයි. එවන් බරපතල අන්දමේ නීතියක් පවතීයැයි යන්න පිළිබඳව මා හට ද එතරම් අවබෝධයක් නොතිබූ අතර ඒ පිළිබඳ මා අවබෝධකර ගත්තේ විපක්ෂයේ ප්‍රබල මන්ත්‍රීවරුන් වරින් වර මා වෙත සපයන ලද තොරතුරු මගිනි.

එකල විපක්ෂ මන්ත්‍රීවරයෙක්ව සිටි සී.වී. ගුණරත්න මහතා ආණ්ඩු පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ ලලිත් අතුලත්මුදලි වැනි ප්‍රබල අමාත්‍යවරුන් සමග යම් යම් දේශපාලන කොන්තර තිබූ අතර ඊට අදාළ කථාබහකදී වත්කම් බැරකම් ප්‍රකාශ පිළිබඳව ද ඔහු විසින් සිහිකරන ලදි. එහි ප්‍රතිඵලය වූයේ ඔහුගේ වත්කම් බැරකම් ප්‍රකාශය මා අතට පත්කිරීම වන අතර එය මා දුටු පළමු ඒ ආකාරයේ ලේඛනයයි. ඉන් උත්තේජනය ලත් මා පාර්ලිමේන්තුවේ සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාගැනීමේ අදිටනින් එවක සිටි මැතිවරණ කොමසාරිස්වරයා ඇමතුව ද ඔහු දෙන ලද්දේ නිශේදනීය පිළිතුරකි. ඔහු මට පැවසුවේ "උසාවි ගිහින් උසාවි නියෝගයක් අරගෙන එන්න" යන්නයි.

මෙම ප්‍රකාශය මා පුදුමයට පත් කරන අතර ඒ පිළිබඳ මා සතුව පැවති දුක්ගැනවිල්ලට සවන්දීමට කිසිවෙක් නොසිටී බව ද ප්‍රකාශ කළ යුතුයි. මේ පිළිබඳ මාගේ අදහස එවකට කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයාව සිටි ජී.එල්. පීරිස් මහතා වෙත දැනුම්දෙන ලද අතර ඔහුගේ පිළිතුර වූයේ මාගේ උත්සාහය ඉතා වැදගත් බවත් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට මා හට අයිතියත් ඇති බවත් ය. එකී කරුණම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට ද සැළකරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇමතිවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කළ යුතු යැයි යන්න වසර 1994 පැවති මැතිවරණයේදී ප්‍රකාශයට පත්කළ මැතිවරණ පොරොන්දු වලට ද ඇතුළත් කරන ලදි. එය ඒ වන විට හෝ මේ තාක් කිසිවෙක් විසින් නොකරන ලද ඓතිහාසික කාර්යයක් බව ද ප්‍රකාශ කළ යුතුව ඇත.

පොදු පෙරමුණ එලෙස එය භාර ගත්තා පමණක් නොව ඔවුන්ගේ ප්‍රධාන මැතිවරණ පොරොන්දු 10 ඇතුළත් වගන්ති වලින් ප්‍රධාන එකක් වූයේ මෙයයි. ඉන් ද නොනැවතී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ප්‍රධාන පිරිස අත්තනගල්ලේ පිහිටි බණ්ඩාරනායක සමාධිය අසළට ගොස් ඊට අදාළ දිවුරුමක් ද දෙන ලදි.

ඉන් අනතුරුව එවකට පාර්ලිමේන්තුවේ කථානායකවරයා ලෙස සිටි කේ.බී. රත්නායක මහතා මගින් ද වත්කම් බැරකම් ප්‍රකාශ කිහිපයක් ඉල්ලා සිටින ලද අතර ඔහු මා වෙත දුරකථනයෙන් අමතා ප්‍රකාශ කරන ලද්දේ තමන් ද මේ පිළිබඳ අවබෝධයෙන් නොසිටි බවත් ඉදිරියේ දී අදාළ ගාස්තු ගෙවා වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගන්නා ලෙසත් ය. අනතුරුව දින කිහිපයක් ගෙවී ගිය පසු ඔහු මා හට පවසන ලද්දේ මන්ත්‍රීවරුන් සමහර දෙනෙක් අදාළ ප්‍රකාශ ලබාදී නොමැති බවත් දැනට පාර්ලිමේන්තුව සතුව පවතින ප්‍රකාශ පමණක් ලබාගත හැකි බවත් ය. තවදුරටත් ඔහු ප්‍රකාශ කරන ලද්දේ එලෙස වත්කම් බැරකම් ප්‍රකාශ ලබානොදෙන පිරිස් වෙත බලකිරීමේ හැකියාවක් තමන්ට නොමැති බවත් කළ හැකි එකම දේ නම් ඔවුන්ට යම් දැනුම්දීමක් කිරීම පමණක් බවත්ය.

අනතුරුව මා හට අවශ්‍ය මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුගේ පමණක් ප්‍රකාශ ලබාගැනීමට ක්‍රියා කරන ලද අතර එවකට මැතිවරණ කොමසාරිස්වරයාව සිටි දයානන්ද දිසානායක මහතාට ද ලිපියක් ලියන්නට ක්‍රියා කලෙමි. එහිදී මා අවධාරණය කරන ලද්දේ මැතිවරණයක් පැවැත්වීමට ප්‍රථම රට පාලනය කිරීමට උත්සහා දරන අපේක්ෂකයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීම ඔහුගේ වගකීමක් බවත් එසේ නොකරන්නේ නම් ඔහුට එරෙහිව නඩු පවරන බවත්ය.

කෙසේ වුවත් මෙකී පසුබිම හේතුවෙන් වසර 1999 පැවති මැතිවරණයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සහ රනිල් වික්‍රමසිංහ යන දෙදෙනාම තමන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරදීමට

වලබලා ගත්හ. එහිදී එකී ප්‍රකාශන දෙක මවිසින් ඉල්ලන ලද කලෙක මැතිවරණ කොමසාරිස්වරයා ලබාදෙයි ද යන්න පරීක්ෂා කිරීම සඳහා එකී ප්‍රකාශන දෙක ඉල්ලා සිටින ලද අතර ඔහු ඒවා මා වෙත තිබුණු අතර මා සිදුකළ කාර්යය වූයේ එම ප්‍රකාශන දෙකම අපගේ පුවත්පතෙහි පළ කිරීමකි.

ඉන් අනතුරුව එවකට පත් වූ ආණ්ඩුවේ ජනාධිපති ලේකම්වරයා වූ කුසුම්සිරි බාලපටබැඳි මහතා මගින් ලිඛිතව එවකට පැවති ආණ්ඩුවේ සියලු ඇමතිවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීමට උත්සාහ කල ද එය ද අසාර්ථක විය. ඔහු මුලින් එකඟ වුවද පසුව කිහිපවිටක් ම දුරකථනයෙන් අමතා ඒවා ලබාදීමේ ඇති අපහසුතාවය පිළිබඳව කරුණු දක්වන ලදි. එහෙයින් මාගේ ඊළඟ උත්සාහය වූයේ පුරවැසියෙක් ලෙස අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කිරීමයි. ඒ සඳහා ජනාධිපති ලේකම්වරයා සමග සිදුකරන ලද ලේඛන පිටපත් ද අමුණන ලදි.

මෙම කෙටි කරුණු දැක්වීම මගින් මා උත්සහා කරන ලද්දේ වත්කම් හා බැරකම් ප්‍රකාශන නීතිය මෙරටේ සැගවී ගිය එහෙත් ඉතා ප්‍රබල නීතියක් වන බව දැක්වීමට වන අතර එය සමාජයේ ප්‍රබල කතාබහකට ඔබින ආකාරයට පසුබිම සකස් කිරීම සඳහා මා ද යම් දායකත්වයක් දක්වා ඇති බව මෙහිදී ඔබට පෙනී යනවා ඇත. මාගේ පෞද්ගලික අදහස වන්නේ මෙරටේ කවර තරම් නීති තිබුණ ද ඒවා මහජන සුභසිද්ධිය පිණිස යොදා ගන්නේ ඉතා අවම වශයෙන් බවයි. ඉතා ලස්සන හා ආකර්ෂණීය නීති සම්පාදනයට මෙරටේ දේශපාලකයෝ අති දක්ෂයෝය. වර්ථමානයේ සම්මත වූ තොරතුරු දැනගැනීමේ පනතට ප්‍රථම වසර 2003/2004 කාල සමයේ තොරතුරු නීතිය සම්මත කිරීම සඳහා ගන්නා ලද උත්සහය ඉතා ප්‍රබල විය. ඒ සඳහා පැවති බොහෝ සාකච්ඡා සම්මන්ත්‍රණ තුළදී මා පළ කල එක් අදහසක් වූයේ වත්කම් බැරකම් නීතිය වැනි ප්‍රගතශීලි නීති යටපත් කොට නව නීති හඳුන්වාදීම හරසුන් ක්‍රියාවක් බවයි. හේතුව නම් එය ද පදනම් කරගෙන තිබුණේ ජනතාවට තොරතුරු සැපයීමයි. එහෙත් ඊට සවන්දීමට සමත් දේශපාලකයෝ එකල නොසිටි අතර මෙකල ද ඇතැයි නොසිතමි.

***මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වසර 2016 දෙසැම්බර් මස 31 වැනි දින කොළඹ දී, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය හා සබැඳිව පවත්වන ලද වැඩසටහනේදී රාවය පුවත්පතෙහි උපදේශක කර්තෘ වික්ටර් අයිවන් මහතා දක්වන ලද අදහස්වල සංක්ෂිප්තයකි.***